**ස්ලින්ටෙක් ඇකඩමි -2017/2018**
**---------------------------------**

ස්ලින්ටෙක් ඇකඩමියේ (“සමාගම”) 2018 මාර්තු 31 දිනෙන් අවසන් මාස හයක කාලපරිච්ඡේදයක් සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ හා අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් මාස හය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරනු ලබන සමාගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ මාගේ අදහස් හා නිරීක්ෂණයන් සම්බන්ධයෙන් මෙම වාර්තාව නිකුත්කරනු ලැබේ.

**1.1** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම
**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණයේ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“මණ්ඩලය”) වගකීම වේ.

**1.2** විගණකගේ වගකීම
**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** මූල්‍ය ප්‍රකාශන
**---------------**

**2.1** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-------------------------------------------**

**(a)** සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව මුදල් පදනම මත ගිණුම් තැබීමට ඉඩදෙනු නොලැබේ. කෙසේ වුවද, ඊට පටහැනි ලෙස සමාගම විසින් ආදායම ලෙස ගණනය කරන ලද රු. 3,200,000 ක් වූ ආදායම් වටිනාකම

නොසලකා මුදල් පදනම මත ගණනය කරන ලද රු. 1,900,000 ක ආදායම ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආදායම හා ලැබිය යුතු දෑ රු. 1,300,000කින් අඩු වී තිබුණි.

(b) සමාලෝචිත වර්ෂයට අදාළව විලම්භිත ආදායමක් ලෙස එකතුව රු. 3,200,000 ක් හඳුනා ගෙන තිබුණද ගිණුම්ගත කර තිබුණේ රු. 1,000,000 ක් පමණි. ඒ හේතුවෙන් විලම්භිත ආදායම රු. 2,200,000කින් අඩුවෙන් නිරූපණය වී තිබුණි.

(c) පෙර වර්ෂය තුළ මිලදී ගනු ලැබූ රු. 639,687 ක් වටිනා පොත් තොගය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත වී නොතිබුණු අතර පෙර වර්ෂය හා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය ගණනය කර නොතිබුණි.

2.2 මතය
------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම යන ඡේදයේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට ස්ලින්ටෙක් ඇකඩමියෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.3 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව
------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

කෙසේ වුවද, සමාගමේ ශුද්ධ වත්කම්, එහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකටත් වඩා අඩු බවත් 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වැනි වගන්තිය අනුව සමාගම විශාල ප්‍රාග්ධන ඌනතාවයකට මුහුණ දී සිටින බවත් සැලකිල්ලට ගත යුතු වේ. මෙම තත්ත්වය අවම කිරීම සඳහා, සමාගම විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 29හි පැහැදිලි කෙරේ.

3. මූල්‍ය සමාලෝචනය
--------------------

3.1 මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ මාස 6 ක කාලය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 29,123 ක ශුද්ධ අලාභයක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය
-------------------------

**4.1** කළමනාකාරණ ක්‍රියාකාරකම්

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

1. ආරම්භක අධ්‍යයන වර්ෂය සඳහා සහභාගි වූ සිසුන් පහළොස් දෙනාගෙන් සිසුන් 13 දෙනෙකු සඳහා රු. 100,000 සිට රු. 500,000 දක්වා වූ වට්ටම් පරාසයක් පිරිනමා තිබුණි. එසේම, සිසුන් හය දෙනෙකු සඳහා රු. 150,000 සිට රු. 300,000 දක්වා වූ ණය පහසුකම් ලබා දී තිබුණි. තවද, වට්ටම් ලැබූ සිසුන් හතර දෙනෙකු සඳහා එක් අයෙකුට රු. 400,000 බැගින් වූ ශිෂ්‍යත්ව ලබා දී තිබුණි. කෙසේ වුවද, මෙම පහසුකම් නිසි අනුමැතියකින් හෝ අනුමත යෝජනා ක්‍රමයකින් තොරව ලබා දී තිබුණි.

2. 2017 අගෝස්තු 16 දිනැති අංක 2032/23 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ අරමුණින් උපාධි පිරි නමන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා නැනෝ ටෙක්නොලොජි (පුද්) සමාගම හඳුන්වා දී තිබුණි. තවද, ස්ලින්ටෙක් ඇකඩමිය විසින් වර්තමානයේදී පශ්චාත් උපාධි ලබා දෙන බවද ඇකඩමියෙහි ප්‍රධාන විධායක නිලධාරී විසින් ඔහුගේ 2018 සැප්තැම්බර් 20 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබුණි. කෙසේ වුවද, සඳහන් කළ අරමුණු සනාථ කිරීමට තරම් ප්‍රමාණවත් පිළිගත හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

3. ශ්‍රී ලංකා නැනෝ ටෙක්නොලොජි (පුද්) සමාගම වෙත 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් ස්ලින්ටෙක් ඇකඩමිය විසින් එකතුව රු. 5,708,045 ක මුදලක් කාර්ය මණ්ඩල වියදම් ලෙස ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම වියදම සනාථ කිරීම සඳහා කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද වැඩ විස්තර විගණනය වෙත ඉදිරිපත් කිරීමට ස්ලින්ටෙක් ඇකඩමිය අපොහොසත් විය. ඒ හේතුවෙන් මෙම ගෙවීමෙහි නිරවද්‍යතාවය පිළිබඳ විගණනයට සෑහීමකට පත් විය නොහැකි විය.

4. ස්ලින්ටෙක් ඇකඩමිය සඳහා සිසුන් බඳවා ගැනීමේ විධිමත් පොදු ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය විය. ලියාපදිංචි වී ඇති සිසුන් 14 දෙනා අතුරින් සිසුන් පස් දෙනෙකු පමණක් රු. 2,500 ක් වූ අයදුම්පත් ගාස්තු ගෙවා තිබුණු අතර ලියාපදිංචි ගාස්තුව වූ රු. 100,000 ගෙවා තිබුණේ ස්ලින්ටෙක් (පුද්) සමාගමෙහි සේවය කරන සිසුන් 4 දෙනෙකු ඇතුළු සිසුන් පස් දෙනෙකු පමණි. තවද, පාඨමාලා ගාස්තුවේ පළමු වාරිකය ඔවුන් විසින් ගෙවා නොතිබුණු බවද නිරීක්ෂණය විය.

5. ස්ලින්ටෙක් ආයතනය ඔස්සේ පර්යේෂණ ධාරිතාවය ගොඩනැගීම තුළින් නැනෝ සහ උසස් තාක්ෂණයන්හි පශ්චාත් උපාධි පාඨමාලා පිරිනැමීම ස්ලින්ටෙක් ආයතනය ආරම්භ කිරීමේ මූලික අරමුණක් වී තිබුණි. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා ස්ලින්ටෙක් ඇකඩමිය විසින් ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණය පිළිබඳ පෞද්ගලික සමාගමේ ආයතන පරිශ්‍රය, විද්‍යාගාර, දේශන ශාලා, ජල විදුලිය ආදී වූ භෞතික සම්පත්ද උපදේශකවරුන්, දේශකවරුන් සහ පරිපාලන කාර්ය මණ්ඩලය ආදී වූ මානව සම්පත්ද උපයෝගී කර ගෙන තිබුණි. එවැනි පසුබිමක් යටතේ ස්ලින්ටෙක් ඇකඩමිය විසින් ඉටුකරනු ලබන කාර්යභාරය ශ්‍රී ලංකා නැනෝ ටෙක්නොලොජි (පුද්) සමාගම විසින් සිදු කළ හැකිව පවතින බැවින් ඇකඩමිය වෙනම ආයතනයක් ලෙස තව දුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොපවතින බව විගණනයට නිරීක්ෂණය විය.